21. 'අ' ධීවර කටයුතු හා සම්බන්ධ ස්ථාන

1. මයිලෙඩ්ඩි
2. පැලියගොඩ
3. කල්පිටිය

'ආ' ධීවර කටයුතු

A - ධීවර අභ්‍යාස මධ්‍යස්ථානය
B - ප්‍රධාන මාළු තොග වෙළඳසැල
C - මසුන් ගොඩබාන ධීවර වරාය
D - මසුන් වියළීම හා ඉස්සන් වගාව

(1) A, B, C (2) B, D, C (3) C, B, A (4) C, B, D (.........)

22. 'අ' වායුගෝලීය ස්තර

1. පරිවර්තී ගෝලය
2. අපරිවර්තී ගෝලය
3. මෙසෝ ගෝලය

'ආ' විශේෂ ලක්ෂණ

A - ඕසෝන් ස්තරය පිහිටා ඇත
B - පෘථිවි පෘෂ්ඨයේ සිට 8 km - 12 km පමණ දක්වා ඉහළට විහිදේ
C - වායුගෝලයේ අඩුම උෂ්ණත්වය මෙම කොටසේ පවතී
D - උෂ්ණත්වය ඉතා අධික ස්තරය මෙයයි

(1) A, B, C (2) B, A, C (3) B, C, D (4) C, B, D (.........)

23. 'අ' ඛනිජ වර්ගය

1. සිලිකාවැලි
2. ඉල්මනයිට්
3. සර්කොන්

'ආ' ව්‍යාප්තව ඇති ප්‍රදේශ

A - නිලාවෙලි
B - බලංගොඩ
C - මාරවිල
D - එප්පාවල

(1) A, B, C (2) B, D, C (3) C, A, B (4) D, A, B (.........)

24. 'අ' මෙට්‍රික් සිතියම්වල සංස්කෘතික ලක්ෂණ පෙන්වීමට භාවිත කර ඇති වර්ණ

1. කහ පැහැය
2. රතු පැහැය
3. කළු පැහැය

'ආ' සංස්කෘතික ලක්ෂණ

A - දුම්රිය මාර්ග
B - ගෙවතු
C - පාසල
D - වාරි ඇළ

(1) A, B, C (2) B, C, A (3) B, C, D (4) D, B, A (.........)

- අංක 25 සිට 36 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා එට හිමි **අංකය ඉදිරියේ ඇති කිත් ඉර මත ලියා දක්වන්න.**

25. පහත A සිට E දක්වා ඇති තොරතුරු අතුරින් තිරිඟු වගාවට අදාළ තොරතුරු දෙකක් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

WWW.OLEVELAPI.COM

A – ඒකබෝග වගාවක් වීම හා ගොවිබිම් විශාල වීම
B – මිශ්‍රබෝග වගාවක් වීම හා කුඩා ගොවිපළවල් ලෙස සංවිධානය වී තිබීම
C – මහා පරිමාණ වශයෙන් යාන්ත්‍රීකරණයට භාජනය වී තිබීම
D – පැළ වැඩෙන කාලයේ සිසිල් තෙත් දේශගුණය හා චර්නොසම් පස
E – දියළු පස සහිත තැනි බිම්වල ව්‍යාප්ත වීම

(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) D හා E ය. (.........)

26. අකුණු වර්ග අතුරින් ප්‍රජාවට සෘජුවම බලපාන්නේ,

(1) පෘථිවි අකුණු ය. (2) වායු අකුණු ය. (3) වලා අකුණු ය. (4) සංවහන අකුණු ය. (.........)

27. ලෝකයේ කපු වගා කරන ප්‍රධාන රටවල් යුගලය වනුයේ,

(1) චීනය හා ඉන්දියාව ය. (2) ඊජිප්තුව හා දකුණු කොරියාව ය.
(3) ජපානය හා උගන්ඩාව ය. (4) පකිස්ථානය හා ඕස්ට්‍රේලියාව ය. (.........)

28. උතුරු අත්ලාන්තික් සාගරය ආශ්‍රිතව හටගන්නා සුළි සුළං හඳුන්වනු ලබන විශේෂ නාමය වන්නේ,

(1) විලි විලීස් ය. (2) හරිකේන් ය. (3) ටයිෆූන් ය. (4) බැගියෝ ය. (.........)

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

